පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා : අංක **492**

## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පොළොන්නරුව

**පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව
විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන්
ස්ථාවර නියෝග අංක 119(4) යටතේ
ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර
පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.**

பாராளுமன்ற வெளியீட்டு தொடர் இல - 492

## மாவட்டச் செயலகம - பொலன்னறுவை

**பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால்
முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற்
கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ
அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது
தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும்
பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.**

**Parliamentary Series Number**: 492

## District Secretariat – Polonnaruwa

**Submission of observations of Hon. Minister
and steps taken with regard to the reports
tabled by the Committee on public Accounts in
terms of Standing Order No. 119 (4)**

ඇමුණුම 01

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද ස්ථාවර නියෝග 119/(4)**

**සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගනු ලබන පියවරයන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.**

**පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා : අංක 492**

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පොළොන්නරුව**

| රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු හා මහපෙන්වීම් | ගණන් දීමේ නිළධාරි විසින් ගත් ක්‍රියාමාර්ග හා වර්තමාන ප්‍රගතිය |
|---|---|
| පළමු කොටස | |
| ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 හි 8.1 හා 8.2 ඡේද ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරිමට කටයුතු කරන ලෙස සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන් වෙත උපදෙස් ලබා දී ඇත.<br>ඒ අනුව මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරිම සම්බන්ධයෙන් නිකුත් කර තිබූ 2013.07.12 දිනැති රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු චක්‍රලේඛ ලිපිය මඟින් වත්කම් වර්ගීකරණය කර ඊට අදාළ සංකේතාංක ලබා දී ඇති අතර, රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 හි 8.1 හා 8.2 ඡේද ප්‍රකාරව CIGAS පරිගණක වැඩසටහන තුළ ස්ථාවර වත්කම් මොඩියුලයක් සකසා ඇති බැවින්, එමඟින් වත්කම් සියල්ල ගිණුම්ගත කර යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලබයි. |
| අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත. | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 20219.05.21 දිනැති අංක 01/2019 චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන අංශය විසින් 2024 වර්ෂයේ සිට අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන යන බව සඳහන් කරමි. |
| විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 වගන්තිය ප්‍රකාරව විගණන විමසුම් සඳහා මසක් ඇතුළත පිළිතුරු සකස් කිරීමට සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මෙන්ම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සෑම අංශයක්ම දැනුවත් කිරිමට කටයුතු කර ඇති අතර,ඒ අනුව කටයුතු සිදු කෙරෙමින් පවතින බව කාරුණිකව දන්වමි. |
| වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත,ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ සිදු කර අදාල වාර්තා නියමිත කාල රාමුවට අනුව ඉදිරිපත් කරන ලෙස සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මෙන්ම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සෑම අංශයක්ම දැනුවත් කිරිමට කටයුතු කර ඇති අතර,ඒ අනුව කටයුතු සිදු කෙරෙමින් පවතින බව කාරුණිකව දන්වමි. |
| වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි | වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ දෙකක් හැර අන් සියළුම ණය ශේෂ අයවෙමින් හා අය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.මෙ ණය ශේෂ 02 අතුරින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සේවය කල එස්.ඒ.පී.මාකෙහෙල්වල මහතාගේ ණය සුරැකුම් රක්ෂණාවරණයක් ඇපයට තබා ණය |

| | |
|---|---|
| | ලබාගෙන ඇති හෙයින් ජාතික රක්ෂණභාර අරමුදල වෙතින් එම ණය පියවා ගැනීම සඳහා ඉල්ලීම් කර ඇති අතර දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කල කේ.පී.පී.ගුණතිලක මහතාගේ ණය ශේෂය එවකට ඇප රහිතව ණය ලබා දුන් ප්‍රාදේශීය ලේකම් වෙතින් හා ගණකාධිකාරී වෙතින් විශ්‍රාම වැටුපෙන් අය කර 2026 අප්‍රේල් මස වන විට අවසන් වී ඇත. |
| **දෙවන කොටස** | |
| මාසිකව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි | මේ සම්බන්ධයෙන් රාජ්‍ය ආරක්ෂක,ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක 2/2021 හා 2021.02.12 දිනැති චක්‍රලේඛය අනුව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව සෑම මසකම පැවැත්විය යුතු අතර,අවම වශයෙන් කාර්තුවකට දින 02 ක් හෝ පැවැත්විය යුතු බවට සඳහන්ව ඇත.දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති ධුරය දරනුයේ දිස්ත්‍රික්කය නියෝජනය කරන මහජන නියෝජිතයෙකු විසින් බැවින් ඔහු හෝ ඇය විසින් පාර්ලිමේන්තු සැසිවාර පැවැත්වෙන දින සසඳා බලා ලබා දෙනු ලබන දින පදනම් කර ගෙන මෙම රැස්වීම පැවැත්වීම සිදු කර ඇත. |
| දිස්ත්‍රික් නිවාස කමිටුව මාසිකව රැස් වී නොතිබුණි | දිස්ත්‍රික් නිවාස කමිටුව සෑම මසකම ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ රැස්වීමට සමාන්තරව පැවැත්වීමට කටයුතු යොදා ඇත. |
| දිස්ත්‍රික් පොහොර සම්බන්ධීකරණ කමිටුව මාසිකව රැස් වී නොතිබුණි | දිස්ත්‍රික් පොහොර සම්බන්ධීකරණ කමිටුව කන්නයක් ආරම්භයේදී පමණක් පවත්වනු ලබන අතර එහිදී ලබා ගත් තීරණ මත ඉදිරි කටයුතු සිදු කරනු ලබයි.ඒ අනුව මෙම කමිටුව පවත්වා ඇත. |
| දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටු මාසිකව රැස් වී නොතිබුණි | දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටුව වසරකට වාර 04ක් වන පරිදි පැවැත්වීමට කටයුතු යොදා ඇත. |
| ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය,යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ/අහිතකර මට්ටමේ විය | 2023 දෙසැම්බර් 31 දිනට පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කර ඇති බව පෙන්වා දී ඇත. ඉදිරියේ දි පැහැදිලි මතයක් ලබා ගැනීම වෙනුවෙන් කටයුතු සිදුකරමින් පවතී. |
| සමාලෝචිත වර්ෂයේ කාර්ය සාධන ඉලක්ක නියමිත දිනට ඉදිරිපත් කර නොමැත. | 2023 වර්ෂයට අදාළව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කොට, එයින් ඉලක්කගත කළ පහත දැක්වෙන ක්ෂේත්‍රයන්හි අභිමතාර්ථ සාධනීය ලෙස සපුරා ගැනීමට කටයුතු කර ඇත.(දර්ශක- වාර්ෂික කාර්යය සාධන වාර්තාව)<br>➢ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දිඹුලාගල,ඇලහැර,මැදිරිගිරිය හා වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ප්‍රමුඛව සිදු වූ ආරක්ෂිත වන සත්ව හානි සම්බන්ධ වන්දි අයදුම්පත්‍ර,වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු වාර්තා සහ අදාළ ප්‍රාදේශීය ලේකම් වාර්තා පදනම් කර ගනිමින් වන්දි කමිටු හරහා අනුමත කරනු ලදුව 50%කට වැඩි ප්‍රතිශතයකින් වන්දි ගෙවීම් වර්ෂය තුළදීම නිම කර ඇත.<br>➢ දිස්ත්‍රික්කය පුරා විසිරී සිටින වැඩිහිටි දීමනා,වකුගඩු රෝගී සහ ආබාධිත දීමනාලාභී ජනතාව වෙත නිසි කලට ප්‍රතිපාදන ලබා දෙමින්,2023 ජූනි මස සිට අස්වැසුම දිළිඳු සහන වැඩසටහන ක්‍රියාත්මක කරමින්,එකී ගෙවීම්වලින් අපේක්ෂිත සමාජ සුභ සාධන සාක්ෂාත් කර ගැනීමට කටයුතු කර ඇත. |

| | |
|---|---|
| | ➢ කෘෂිකාර්මික ආර්ථිකයක් සහිත පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අස්වනු,රාජ්‍ය යාන්ත්‍රණයෙහි පූර්ණ මැදිහත්වීම යටතේ නිසි කලට නිසි මිලට මිලදී ගැනීමට සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් දිරිගන්වමින්,ශ්‍රී ලංකාවේ දේශීය සහල් නිෂ්පාදන ඉලක්ක සපුරාලීමට කටයුතු කර ඇත.<br><br>➢ රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයීය චක්‍රලේඛ අංක 02/2018 හා 02/2018(1) මගින් පෙන්වා දී ඇති ආකාරයට මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කොට,ඒ අනුව නිළධාරීන් පුහුණු කිරීම තුළින් මානව සම්පත සංවර්ධනය කිරීමේ දර්ශක 100% - 90% පරාසයේ රඳවාගෙන ඇත. |
| දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු රැස්වීම් කාර්තුවකට 01 බැගින් රැස් වී නොතිබුණි | මත්ද්‍රව්‍ය නිවාරණ කමිටුව වසරකට වාර 04ක් වන පරිදි පැවැත්වීමට කටයුතු යොදා ඇත. |
| දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුව අවම වශයෙන් කාර්තුවකට වරක් රැස් වී නොතිබුණි | දිස්ත්‍රික්කයේ එක් එක් කොට්ඨාශ තුළ නොවිසඳුණු ඉඩම් ගැටළු හා ඉඩම් නිදහස් කිරීම සම්බන්ධ තොරතුරු හා ඉඩම් යෝජනා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලැබීම අනුව දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු ව පවත්වනු ලබන බව කාරුණිකව දන්වමි. |
| 2005 අංක 13 දරණ ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත අනුව ආපදා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි | 2005 අංක 13 දරණ ශ්‍රී ලංකා ව්‍යසන ව්‍යසන කළමනාකරණ පනත අනුව ආපදා කළමනාකරණ කමිටු පවත්වා ඇත. |
| විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. | රජයේ ගිණුම් කාරක සභාව විසින් තවදුරටත් නොවිස දී ඇති කරුණු 03 ක් පෙන්වා දී තිබූ අතර, එම කරුණු 03ම මේ වන විට සම්පූර්ණයෙන්ම විසඳී අවසන්ව ඇත. |
| උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිළධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි | වාර්ෂික ස්ථාන මාරුවීම් අදාළ පටිපාටියට අනුකූලව නියමිත කාල රාමු අනුගමනය කරමින් සිදු කරන අතර අභ්‍යන්තර ස්ථාන මාරුවීම්ද වර්ෂ 05 කට වැඩි සේවා කාලයක් සඳහා වාර්ෂිකව ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත.ඒ අනුව 2026 .04.02 දින සිට එම ස්ථාන මාරු ක්‍රියාත්මක කර ඇත. |
| දිස්ත්‍රික් පරිසර කමිටුව අවම වශයෙන් මාස 02 කට වරක් රැස් වී නොතිබුණි | දිස්ත්‍රික් පරිසර කමිටුව දෙමසකට වරක්,දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවට සමගාමීව පැවැත්වීමට කටයුතු යොදා ඇත. |

.........................................

දිස්ත්‍රික් ලේකම්/දිසාපති

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

සුජන්ත ඒකනායක
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
පොළොන්නරුව

.........................................

ප්‍රධාන ගණකාධිකාරි

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

එම්. කලෛයිශදානසුන්දරම්
ප්‍රධාන ගණකාධිකාරි
පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් වෙනුවට

## ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් පෞද්ගලික අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

එස්.ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

## ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2026 වර්ෂය තුල දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළගා කර ගැනීමට අපේක්ෂා කරමි.

මහාචාර්ය ඒ.එච්.එම්.එච්.අබයරත්න (පා.ම.)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය

මහාචාර්ය ඒ.එච්.එම්.එච්. අබයරත්න
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍ය
නිදහස් චතුරශ්‍රය - කොළඹ 07.